SLGURU.LK

ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
Sri Jayewardenepura Education Zone
දෙවන වාර පරීක්ෂණය - 2026

60	S	I , II

ශ්‍රේණිය - 10

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I, II
Business & Accounting Studies I, II

කාලය - පැය තුනයි

අමතර කියැවීමේ කාලය - මිනිත්තු 10

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I

i. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
ii. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සාපේක්ෂව කවය තුළ (X) යොදන්න.

- **පහත සිද්ධිය ඇසුරෙන් අංක (1) සිට (5) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

"ශාන් හාඩ්වෙයාර්" නමින් ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ශාන්ත තම ව්‍යාපාරය අසල පිහිටි "මසුරංග" මාවතිය පාන අලෙවිසැලෙන් කොළ කඳ හෝ "කෝපි මල් තේ" පානය කිරීම සිදු කරයි.

01. "ශාන් හාඩ්වෙයාර්" ව්‍යාපාරය සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක්ද?
(1) ආහාර (2) නිවාස (3) සෞඛ්‍යය (4) ආරක්ෂාව

02. "ශාන් හාඩ්වෙයාර්" ව්‍යාපාරයේ නාමය ලියාපදිංචිය කිරීම අනිවාර්ය වීමට හේතුව නම්,
(1) ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිසැලක් වීම නිසා.
(2) ව්‍යාපාරයේ අයිතිකරු තහවුරු කර ගැනීමට අවශ්‍ය වීම නිසා.
(3) ලාභ හෝ අලාභ තනිව භුක්ති විඳීම නිසා.
(4) ශාන්තගේ සම්පූර්ණ නමින් ව්‍යාපාරය පවත්වාගෙන නොයන නිසා.

03. "ශාන් හාඩ්වෙයාර්" ව්‍යාපාරය අයත් ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ ලක්ෂණයක් වන්නේ,
(1) භෞතික පුද්ගලභාවයක් තිබීම.
(2) ලියාපදිංචිය අනිවාර්ය නොවීම.
(3) කොටස් නිකුතුවෙන් ප්‍රාග්ධනය රැස්කර ගැනීම.
(4) අඛණ්ඩ පැවැත්මක් තිබීම.

04. සිද්ධියේ සඳහන් "කඳ" සකස් කිරීමට භාවිතා කරන කොළ වර්ග අයත් වන නිෂ්පාදන සාධකය වන්නේ,
(1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය (4) ව්‍යවසායකත්වය

SLGURU.LK
For Educational Purpose Only

05. ඉහත සිද්ධියට අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) "මසුරංග" ව්‍යාපාරය භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.
(2) "මසුරංග" සහ ශාන් හාඩ්වෙයාර් යනු සේවා සැපයීමේ ව්‍යාපාර වේ.
(3) "මසුරංග" යනු ශාන් හාඩ්වෙයාර් ව්‍යාපාරයේ ඇල්මැෂි පාර්ශ්වයකි.
(4) ශාන්ත, "මසුරංග" ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසර සාධකයකට නිදසුනකි.

06. ඇල්මැති පාර්ශ්වයක් සහ ඔවුන් ව්‍යාපාරය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණක් නිවැරදිව පිළිවෙලින් දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

(1) අයිතිකරු - තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
(2) සැපයුම්කරු - අඛණ්ඩව ඇණවුම් ලබාගැනීම.
(3) රජය - රැකියා සුරක්ෂිත බව.
(4) සේවකයෝ - සමාජ සුභසාධනයට දායක වන්නේ දැයි සොයා බැලීම.

07. ව්‍යාපාරයක බාහිර පරිසර සාධක පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ගනුදෙනුකරුවෝ - කළමනාකරුවෝ
(2) කළමනාකරුවෝ - සැපයුම්කරුවෝ
(3) ගනුදෙනුකරුවෝ - සැපයුම්කරුවෝ
(4) සේවකයෝ - ගනුදෙනුකරුවෝ

08. රජය පොලිතින් බෑග් භාවිතය තහනම් කිරීම පොලිතින් බෑග් නිෂ්පාදකයින්ට .....(1)..... වන අතර, කඩදාසි බෑග් නිෂ්පාදකයින්ට ..... (2) ..... වේ.

1 සහ 2 ස්ථානවලට ගැළපෙන පිළිතුරු වන්නේ,

(1) තර්ජනයක්, ශක්තියක්
(2) තර්ජනයක්, අවස්ථාවක්
(3) දුර්වලතාවයක්, ශක්තියක්
(4) දුර්වලතාවයක්, අවස්ථාවක්

09. පහත සඳහන් ව්‍යාපාර අතුරෙන් සේවා සැපයීමේ ව්‍යාපාරයක් නොවන්නේ,

(1) තැපැල් කාර්යාලය
(2) රෝයල් සෙරමික්ස්
(3) ලංකා බැංකුව
(4) සෙලින්කෝ ඉන්ෂුවරන්ස් සමාගම

10. අලංකාර සුරතල් මාළු ටැංකි නිෂ්පාදන ආයතනයක භාවිතා කරන පහත සඳහන් දෑ අතුරෙන් නිෂ්පාදන සාධකයක් වන භූමියට නිදසුනක් වන්නේ,

(1) දොළ පාරෙන් සොයාගන්නා විවිධ හැඩැති ගල් කැට
(2) පිරිසිදු කළ වැලි
(3) රෝපණය කළ ජලජ ශාක
(4) කලාත්මක දැව කොටස්

11. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයත් සහ ස්වේච්ඡා සහ විවෘත සාමාජිකත්වය ලක්ෂණ වශයෙන් දැකිය හැකි ව්‍යාපාර සංවිධාන සඳහා නිදසුනක් නම්,

(1) කෘෂි රක්ෂණ මණ්ඩලය
(2) රුවන්මග සංචාරකයෝ
(3) සීමාසහිත සුවසෙත රෝහල පුද්ගලික සමාගම
(4) සීමාසහිත තේ වගාකරුවන්ගේ සමූපකාර සමිතිය

- **පහත සඳහන් තොරතුරු ප්‍රශ්න අංක 12 සහ 13 සඳහා අදාළ වේ.**

  ව්‍යාපාර කිහිපයක් පහත දැක්වේ.
  - A. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
  - B. රසාංජලී ට්‍රේඩර්ස්
  - C. සෙනෙවිරත්න සහ පුත්‍රයෝ
  - D. සීමාසහිත සදරේඛා සමාගම
  - E. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

12. තනි පුද්ගල ව්‍යාපාරයක් සහ හවුල් ව්‍යාපාරයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
    (1) A D (2) B C (3) B D (4) A E

13. නීතිමය පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
    (1) B C E (2) A B D (3) C D E (4) A B C

14. අදාළ පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තියට අනුව කටයුතු කරන අවස්ථාවක් නම්,
    (1) සංස්ථාපිත සමාගමක් ලියාපදිංචි කිරීමේදී
    (2) ලිඛිත හවුල් ගිවිසුමක් පවත්වාගෙන යාම සඳහා
    (3) සුභසාධක සමිති පිහිටුවීමේදී
    (4) තනි පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමේදී

15. වගකීම සීමාසහිත වීම පහත දැක්වෙන කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසියක්ද?
    (1) තනි පුද්ගල ව්‍යාපාර
    (2) හවුල් ව්‍යාපාර
    (3) සංස්ථාපිත සමාගම්
    (4) ඉහත සඳහන් සියලුම ව්‍යාපාර සංවිධාන

16. ලාභ අරමුණු කර නොගත් රාජ්‍ය අංශයේ ව්‍යාපාර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    (1) රාජ්‍ය සමාගම්, රාජ්‍ය සංස්ථා
    (2) රාජ්‍ය සංස්ථා, රාජ්‍ය දෙපාර්තමේන්තු
    (3) රාජ්‍ය දෙපාර්තමේන්තු, සමූපකාර සමිති
    (4) සමූපකාර සමිති, රාජ්‍ය සංස්ථා

17. ගිණුම්කරණයේ ප්‍රධානතම අරමුණ වන්නේ,
    (1) ව්‍යාපාරයේ ලාභය ගණනය කිරීම.
    (2) ඇල්මැති පාර්ශ්වයන්ට තොරතුරු ලබාදීම.
    (3) ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ දැනගැනීම.
    (4) සිදුවිය හැකි වංචා වැළැක්වීම.

18. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා එන්නා වූ, ව්‍යාපාරය විසින් පාලනය කරන සම්පත්,
    (1) ආදායම් ය. (2) හිමිකම් ය. (3) වත්කම් ය. (4) වගකීම් ය.

19. අයිතිකරුගේ හිමිකම වෙනස්වීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක්ද?
    (1) ව්‍යාපාරයට බැංකු ණයක් ලබාගත් විට හිමිකම වැඩිවේ.
    (2) හිමිකම වැඩිවන්නේ ආදායම් නිසා පමණි.
    (3) ආදායම් නිසා හිමිකම අඩු වේ, වියදම් නිසා හිමිකම වැඩි වේ.
    (4) අයිතිකරු විසින් යොදන අමතර ප්‍රාග්ධන නිසාද හිමිකම වැඩි වේ.

SLGURU.LK
For Educational Purpose Only

- පහත දක්වා ඇති තොරතුරු ඇසුරෙන් අංක 20, 21, සහ 22 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉඩම් ගොඩනැගිලි	රු. 500 000
විකිණීමට තබා ඇති භාණ්ඩ	රු. 80 000
මෝටර් රථ	රු. 200 000
බැංකු ණය	රු. 50 000
ණයහිමියෝ	රු. 40 000
මුදල් ශේෂය	රු. 70 000

20. මෙම ව්‍යාපාරයේ මුළු වගකීම්වල වටිනාකම වන්නේ,
(1) රු. 40 000 (2) රු. 50 000 (3) රු. 90 000 (4) රු. 170 000

21. මෙම ව්‍යාපාරයේ ජංගම වත්කම්වල වටිනාකම වන්නේ,
(1) රු. 150 000 (2) රු. 190 000 (3) රු. 270 000 (4) රු. 700 000

22. මෙම ව්‍යාපාරයේ මුළු වත්කම්වල වටිනාකම වන්නේ,
(1) රු. 360 000 (2) රු. 750 000 (3) රු. 770 000 (4) රු. 850 000

- **පහත තොරතුරු අංක 23, 24 ප්‍රශ්න සඳහා අදාළ වේ.**

ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණය පහත දැක්වෙන ආකාරයට පවතී.

වත්කම් (රු.)	=	හිමිකම් (රු.)	+	වගකීම් (රු.)
400 000	=	350 000	+	50 000

මෙම ව්‍යාපාරයේ සිදු වී ඇති ගනුදෙනු දෙකක් පහත දැක්වේ.

A. රු. 50 000 කට මිලදීගත් භාණ්ඩ තොගය රු. 75 000 කට අත්පිට මුදලට විකිණීම.
B. රු. 1 000 ක පොලිය ඇතුළත්ව බැංකු ණය වාරිකය රු. 5 000 ක් ගෙවීම.

23. A ගනුදෙනුවෙන් පසු ව්‍යාපාරයේ හිමිකම්වල වටිනාකම කොපමණද?
(1) රු. 350 000 (2) රු. 375 000 (3) රු. 400 000 (4) රු. 425 000

24. A සහ B ගනුදෙනුවලින් පසු ගිණුම්කරණ සමීකරණය පවතින ආකාරය,

වත්කම් (රු.)	**=**	**හිමිකම් (රු.)**	**+**	**වගකීම් (රු.)**
(1) 425 000	=	375 000	+	50 000
(2) 421 000	=	375 000	+	46 000
(3) 420 000	=	374 000	+	46 000
(4) 420 000	=	375 000	+	45 000

25. සිතුමිගේ ව්‍යාපාරයේ පැවති මුළු වත්කම්වල වටිනාකම රු. 150 000 කි. යම් ගනුදෙනුවක් සිදුවීමෙන් පසු මුළු වත්කම්වල වටිනාකම රු. 185 000 ක් විය.
සිදු වී ඇති ගනුදෙනුව වනුයේ,
(1) ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා රු. 35 000 ක පරිගණකයක් අත්පිට මුදලට ගැනීම.
(2) රු. 35 000 ක ගොඩනැගිලි කුලී ගෙවීම.
(3) රු. 35 000 ක මුදලක් තැන්පත් කර ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම.
(4) අයිතිකරු රු. 35 000 ක් වටිනා පරිගණකයක් ව්‍යාපාරයට යෙදවීම.

SLGURU.LK
For Educational Purpose Only

26. "වැඩිවීම හර අඩුවීම බැර" යන ද්විත්ව සටහන් මූලධර්මය අදාළ වන ගිණුමක් නම්,
(1) පොලී ආදායම් ගිණුම
(2) ප්‍රාග්ධන ගිණුම
(3) ප්‍රචාරණ ගාස්තු ගිණුම
(4) බැංකු ණය ගිණුම

27. ව්‍යාපාරයට ලබාගත් බැංකු ණයෙන් රු. 8 000 ක් ආපසු ගෙවීම.
මෙම ගනුදෙනුවට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) බැංකු ණය ගිණුම හර රු. 8 000
ප්‍රාග්ධන ගිණුම බැර රු. 8 000
(2) බැංකු ණය ගිණුම හර රු. 8 000
මුදල් ගිණුම බැර රු. 8 000
(3) බැංකු ණය වාරික ගිණුම හර රු. 8 000
මුදල් ගිණුම බැර රු. 8 000
(4) මුදල් ගිණුම හර රු. 8 000
බැංකු ණය ගිණුම බැර රු. 8 000

28. උදාර තම පෞද්ගලික දුරකථන බිල රු. 1 500 ක් ව්‍යාපාරයේ මුදලින් ගෙවීම නිසා ව්‍යාපාරයේ,
(1) වියදම් වැඩිවේ
(2) වගකීම් අඩුවේ.
(3) වත්කම් වැඩිවේ
(4) හිමිකම් අඩුවේ

29. ලෙජරයේ ඇති ගිණුම් වර්ග පහ සඳහාම නිදසුන් දැක්වෙන ගිණුම් ඇතුළත් පිළිතුර වන්නේ,
(1) මුදල්, බැංකු ණය, ප්‍රාග්ධනය, ගැනිලි, විදුලි ගාස්තු.
(2) ප්‍රාග්ධනය, ණයගැතියෝ, වැටුප්, බැංකු ණය, ණයහිමියෝ.
(3) ණයහිමියෝ, ආයෝජන ආදායම්, මුදල්, ගැනිලි, බැංකු ගාස්තු.
(4) විකුණුම්, ණයහිමියෝ, රක්ෂණ ගාස්තු, ආයෝජන, මුදල්.

30. ව්‍යාපාරයක සිදුවන සෑම ගනුදෙනුවක්ම ප්‍රථමයෙන් සටහන් කරන්නේ,
(1) ලෙජරයේ ය
(2) මූලික සටහන් පොත් වල ය.
(3) මුදල් පොතේ ය
(4) ගිණුම් වල ය.

31. මූලාශ්‍ර ලේඛනයක් සහ එයට අදාළ මූලික පොත පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) ජර්නල් වවුචරය - මුදල් පොත
(2) ලදුපත - සුළු මුදල් පොත
(3) ගෙවීම් වවුචරය - බැංකු ගිණුම
(4) ගැණුම් ඉන්වොයිසිය - පොදු ජර්නලය

32. ව්‍යාපාරයක සිදු වී ඇති ගනුදෙනු දෙකක් පහත දැක්වේ.
A. රු. 8 000 ක් වටිනා ලී බඩු අත්පිට මුදලට ගැනීම.
B. ණයගැතියන්ගෙන් රු. 3 000 ක් ලැබීම.

ඉහත ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ජර්නල් වවුචරය - ගෙවීම් වවුචරය
(2) ලදුපත - ගෙවීම් වවුචරය
(3) ගෙවීම් වවුචරය - ලදුපත
(4) ගැණුම් ඉන්වොයිසිය - විකුණුම් ඉන්වොයිසිය

33. මුදල් පොත සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?
(1) මූලික සටහන් පොතක කාර්යය ඉටු කරයි.
(2) ලෙජර් ගිණුමක කාර්යය ඉටු කරයි.
(3) වැඩිවීම බැර, අඩුවීම හර ද්විත්ව සටහන් රීතිය අදාළ වේ.
(4) ගනුදෙනු මුදල් පොතේ සටහන් කළ විට ද්විත්ව සටහනෙන් එක් සටහනක් අවසන් වේ.

SLGURU.LK
For Educational Purpose Only

34. ව්‍යාපාරයක වත්කම් සහ වගකීම් යන දෙකම අඩුවන ගනුදෙනුව කුමක්ද?
(1) වර්ෂයට අදාළ කඩකුලී රු. 5 000 ක් ගෙවීම.
(2) අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 2 000 ක් ලබා ගැනීම.
(3) රු. 6 000 ක භාණ්ඩ ණයට විකිණීම.
(4) ණයහිමියෙකුට රු. 8 000 ක් ගෙවීම

35. ව්‍යාපාරයක වත්කම් ගිණුම්වල පමණක් සටහන් වන ගනුදෙනුව,
(1) නැවත විකිණීම සඳහා රු. 10 000 කට භාණ්ඩ තොගයක් ණයට ගැනීම.
(2) අත්පිට විකුණුම් රු. 35 000
(3) ණයගැතියෙකු වූ තාරකගෙන් රු. 25 000 ක මුදලක් ලැබීම.
(4) රු. 50 000 ක බැංකු ණයක් ලබාගැනීම

36. හිමිකම්වලට බලනොපාන ගනුදෙනුව වන්නේ,
(1) කොමිස් ආදායම් රු. 12 000 ක් ලැබීම.
(2) රු. 4 500 ක කාර්යාල උපකරණ මිලදී ගැනීම.
(3) රක්ෂණ ගාස්තු රු. 5 000 ක් ගෙවීම.
(4) රු. 500 ක පොලිය සමඟ රු. 5 500 ක බැංකු ණය වාරික ගෙවීම

37. ව්‍යාපාරයක ලද වට්ටම් ගිණුම,
(1) ආදායම් ගිණුමකි.
(2) වියදම් ගිණුමකි.
(3) වගකීම් ගිණුමකි.
(4) වත්කම් ගිණුමකි.

38. ව්‍යාපාරයේ අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 20 000 ක මුදලක් ගැනීම.
ඉහත ගනුදෙනුවේ ද්විත්ව බලපෑම,
(1) මුදල් වත්කම වැඩි වේ හිමිකම වැඩි වේ.
(2) මුදල් වත්කම වැඩිවේ හිමිකම අඩු වේ.
(3) වගකීම් අඩු වේ හිමිකම අඩු වේ.
(4) මුදල් වත්කම අඩු වේ හිමිකම අඩු වේ.

39. ව්‍යාපාරයක ලද වට්ටම රු. 1 000 කින් වැඩිවීමට බලපාන ගනුදෙනුව වන්නේ,
(1) රු. 10 000 ක අත්පිට විකුණුම් අවස්ථාවේදී 10% ක වට්ටමක් ලබාදීම.
(2) ණයහිමියෙකුට රු. 10 000 ක් ගෙවීමේදී අඩුකළ වට්ටම 10%
(3) ණය ගැතියන්ගෙන් ලැබුන මුදල රු. 9 000 අඩුකළ වට්ටම රු. 1 000
(4) රු. 10 000 ක් මිල ලකුණු කළ භාණ්ඩයකට මිලදී ගැනීමේදී 10% ක වට්ටමක් අඩු කිරීම.

40. ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය රු. 6 000 කි. 2025.01.31 දිනට සුළු මුදල් ශේෂය 1 200 ක් නම් 2025.02.01 දින ප්‍රතිපූර්ණය කළයුතු මුදල වන්නේ,
(1) රු. 1 200
(2) රු. 4 800
(3) රු. 6 000
(4) රු. 7 200

For Educational Purpose Only

“The beautiful thing about learning is that nobody can take it away from you.” — B. B. King



Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
Sri Jayewardenepura Education Zone
දෙවන වාර පරීක්ෂණය - **2026**

60	S	I , II

ශ්‍රේණිය - **10**

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - **I, II**
Business & Accounting Studies I, II

කාලය - පැය තුනයි

අමතර කියැවීමේ කාලය - මිනිත්තු **10**

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - **II**

උපදෙස්: පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න දෙකක් ද මයිමින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

01. පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ආහාර තාක්ෂණය පිළිබඳ පාඨමාලාවක් හදාරා ඇති නිර්මාණශීලී තරුණයකු වන සමීර් "රසිහී" නිෂ්පාදන නමින් 2026.01.01 දින පෝෂණීය බිස්කට් වර්ගයක් සකස් කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේය. එදින ඔහු සතු රු. 120 000 ක මුදල් සහ රු. 100 000 වටිනා උපකරණ ද ව්‍යාපාරයට යෙදවීය. ඒක12 ාන% වාර්ෂික පොලියට රු. 50 000 ක බැංකු ණයක් ලබා ගන්නා ලදී. ව්‍යාපාරය පිළිබඳ පාඨමාලාවක් හදාරා ඇති ඔහුගේ මිතුරෙකු වන මලිශ කළමනාකරු ලෙස ද නිෂ්පාදන කටයුතු සඳහා තවත් සේවකයින් දෙනෙකු ද ව්‍යාපාරයේ සේවයට බඳවාගෙන ඇත.

2026 ජනවාරි 31 දිනෙන් අවසන් මාසයේ සිදුවූ ගනුදෙනු පහත දැක්වේ.

	රු.
අත්පිට මුදලට අමුද්‍රව්‍ය මිලදී ගැනීම	20 000
අත්පිට මුදලට ඇසුරුම් ද්‍රව්‍ය මිලදී ගැනීම	5 000
ප්‍රවාහන ගාස්තු ගෙවීම	4 000
ප්‍රචාරණ ගාස්තු ගෙවීම	2 000
බැංකු ණය පොලිය ගෙවීම	500
විදුලි ගාස්තු ගෙවීම	3 500
සේවක වැටුප් ගෙවීම	30 000
කළමනාකරුගේ වැටුප් ගෙවීම	25 000
අත්පිට විකුණුම්	180 000
ණයට විකුණුම්	40 000

පාසල් ආපනශාලාවල පෝෂණයෙන් අඩු ආහාර වර්ග අලෙවිය තහනම් කිරීම නිසා ස්වාභාවික අමුද්‍රව්‍ය වලින් සකස් කර ඇති "රසිහී" නිෂ්පාදන මිලදී ගැනීමට පාසල් සිසුන් මෙන්ම දෙමව්පියන් වැඩි වශයෙන් පෙළඹී ඇත. එබැවින් පාසල් ආපනශාලා වලට "රසිහී" නිෂ්පාදන වැඩි වශයෙන් බෙදා හැරීම සිදු කරයි. රසිහී ව්‍යාපාරය අයත් ව්‍යාපාර සංවිධාන ක්‍රමයට වඩා යම් වාසි අත්කර ගැනීමට "රසිහී" ව්‍යාපාරය 2007 අංක 7 දරණ පනත යටතේ ලියාපදිංචි කිරීමට සමීර් අදහස් කරයි.

i. (අ) "රසිහී" නිෂ්පාදන ව්‍යාපාරය සපුරාලන මූලික මිනිස් අවශ්‍යතාව නම් කරන්න.

(ආ) සිද්ධියේ සඳහන් බාහිර හා අභ්‍යන්තර පරිසරයට අයත් ඇල්මැති පාර්ශ්වයන් දෙකක් පිළිවෙලින් ලියන්න.

SLGURU.LK
For Educational Purpose Only

ii. (අ) "රසිහී" ව්‍යාපාරයේ ශක්තියක් සහ අවස්ථාවක් ලියන්න.

(ආ) "රසිහී" ව්‍යාපාරයේ රුකියා අවස්ථා ලැබීම කුමන පරිසරයට අදාළද?

iii. (අ) "රසිහී" නිෂ්පාදන ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන ක්‍රමය හඳුන්වන්නේ කුමන නමින්ද?

(ආ) සමීර්ගේ අපේක්ෂාව අනුව ලියාපදිංචි කළ පසු ඇතිවන නව ව්‍යාපාර සංවිධාන ක්‍රමය කුමක්ද?

iv. ඉහත (iii) (ආ) හි ඔබ සඳහන් කළ ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසියක් හා අවාසියක් ලියන්න.

v. 2026.01.01 දිනට "රසිහී" ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය අදාළ සහිතව ලියා දක්වන්න.

vi. "රසිහී" ව්‍යාපාරයේ උපකරණ ගිණුම දැක්වීම දක්වන්න.

vii. (අ) මෙම ව්‍යාපාරය භාවිත කර ඇති මූලාශ්‍ර ලේඛනයක් සහ එයට අදාළ මූලිකපොත ලියන්න.

(ආ) 2026 ජනවාරි මාසයේ මුළු විකුණුම් වටිනාකම කොපමණද?

viii. 2026.01. 31 දිනට මුදල් ශේෂය ගණනය කරන්න.

ix. ප්‍රචාරණ ගාස්තු ගෙවීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

x. හිමිකම් අඩුවීමට බලපාන ගනුදෙනු දෙකක් වටිනාකම් සහිතව ලියන්න.

(ලකුණු 2x10=20)

1 කොටස - ව්‍යාපාර අධ්‍යයනය (ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

02.

i. (අ) "අවශ්‍යතා" යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) වුවමනාවක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ)මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට විවිධ භාණ්ඩ හා සේවා ව්‍යාපාරිකයන් විසින් නිර්මාණය කරනු ලබයි.

(ආ)රූපලාවන්‍ය ආයතන, භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර වලට නිදසුනකි.

(ඉ)ව්‍යාපාරයක ගොඩනැගිල්ල පිහිටි ඉඩම නිෂ්පාදන සාධකයක් වන භූමියට අයත්ය.

(ඊ)මාර්ග සංවර්ධනයට අයවැය මගින් මුදල් වෙන් කිරීම, දේශපාලන පරිසරයට අයත් සාධකයකි.

iii. කලාත්මක හැකියාවන්ගෙන් යුතු වරුණ විසින් "හරිත මිතුරෝ" නමින් උද්‍යාන අලංකරණ සේවා සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. අවශ්‍ය උපකරණ ඔහු සතුව පවතින අතර, නිර්මාණ කටයුතු සඳහා අවශ්‍ය පැළෑටි වර්ග කැලයෙන් සොයා ගනියි.

(අ) ඉහත සිද්ධියේ දැක්වෙන නිෂ්පාදන සාධක දෙකක් නම් කර සිද්ධිය ඇසුරෙන් නිදසුන් දක්වන්න.

(ආ) නිෂ්පාදිතයේ ස්වභාවය අනුව "හරිත මිතුරෝ" අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?

iv. නුවන් විසින් සේවකයෙකු වන නයන ගේ ද සහාය ඇතිව, සතිපොළ අසල තේ කඩයක් පවත්වාගෙන යයි. සතිපොළට පැමිණෙන පාරිභෝගිකයන් මෙන්ම සතිපොළේ වෙළෙන්දන් ද නුවන්ගේ තේ කඩයෙන් තේ බීමට පුරුදු වී සිටිති.

(අ) නුවන්ගේ ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්ව දෙකක් නම් කර සිද්ධිය ඇසුරින් නිදසුන් ලියන්න.

(ආ) නුවන්ගේ ව්‍යාපාරයේ දැකිය හැකි ව්‍යාපාර අරමුණක් ලියන්න. (ලකුණු 2x4=8)

SLGURU.LK
For Educational Purpose Only

03.

i. (අ) "ව්‍යාපාර සංවිධානයක් " යනු කෙටියෙන් හඳුන්වන්න.

(ආ) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන ආකාර දෙක සඳහන් කරන්න.

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර අධ්‍යයනය තුළින් ශක්තීන් සහ අවස්ථා හඳුනාගත හැකිය.

(ආ) ව්‍යාපාර සංවිධාන හිමිකාරිත්වය අනුව පොදු සහ පෞද්ගලික ලෙස වර්ග කරයි.

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය සිදු කිරීම සංස්ථාපිත සමාගම් සහ රාජ්‍ය සංස්ථා යන ව්‍යාපාර සංවිධාන දෙකටම පොදු ලක්ෂණයකි.

(ඈ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වේ.

iii. පහත සඳහන් ප්‍රකාශ තුළින් ගම්‍ය වන ව්‍යාපාර පරිසර සාධක නම් කරන්න.

A. එක්වරක් භාවිතා කළ හැකි ප්ලාස්ටික් වතුර බෝතල් තහනම් කිරීමට රජය තීරණය කිරීම.
B. ව්‍යාපාරවල ගෙවීම් කටයුතු සඳහා QR කේත භාවිතා කිරීමට පහසුකම් සැලසීම.
C. බැංකු පොලී අනුපාතිකය ඉහළ දැමීම.
D. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය ඉහළ යාම.

iv. කජු සංස්ථාවට අයත් කජු අලෙවි සැලෙන් කජු තොග වශයෙන් මිලදී ගන්නා නදීකා "නදී ටේස්ට් ෆුඩ්ස් "නමින් කජු කුඩා පැකට් ලෙස සකස් කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

(අ) "නදීටේස්ට් ෆුඩ්ස්"ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ලැබිය හැකි ප්‍රතිලාභ දෙකක් ලියන්න.

(ආ) සිද්ධියේ දැක්වෙන ඇල්මැති පාර්ශ්ව දෙකක් හඳුනාගෙන ඔවුන් "නදී ටේස්ට් ෆුඩ්ස් " ව්‍යාපාරයෙන් සපුරා ගැනීමට අපේක්ෂිත අරමුණු එක බැගින් ලියන්න. (ලකුණු 2x4=8)

04.

i. හවුල් ව්‍යාපාරයක් යන්න කෙටියෙන් හඳුන්වන්න.

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍යයද අසත්‍යයද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයකට නවීන තාක්ෂණය ලබාගැනීමට හැකිවීම ගෝලීය පරිසරය තුළින් ඇතිවන අයහපත් බලපෑමකි.

(ආ) ව්‍යාපාරයකට පිළිගත් සන්නාම නාමයක් පැවතීම එම ව්‍යාපාරයට අවස්ථාවකි.

(ඇ) රාජ්‍ය සංස්ථා රජයේ මුදල් රෙගුලාසි වලට යටත් විය යුතුය.

(ඈ) රාජ්‍ය දෙපාර්තමේන්තු පූර්ණ රාජ්‍ය හිමිකාරීත්වය සහිත ව්‍යාපාර සංවිධාන වර්ගයකි.

iii. වෘත්තීය පුහුණු අධිකාරියේ ජලනල පාඨමාලාවක් හදාරා ඇති හසිත, සීමාසහිත හසිත වෝටර් සොලූෂන් සමාගම නමින් ජලනල පද්ධති සවිකිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

(අ) සිද්ධියේ සඳහන් ව්‍යාපාර අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ග දෙකෙහි දැකිය හැකි ලක්ෂණය බැගින් ලියන්න.

(ආ) සිද්ධියේ දැක්වෙන ව්‍යාපාර සංවිධාන දෙක අරමුණු අනුව වර්ග කර දක්වන්න.

iv. පහත දැක්වෙන ව්‍යාපාර අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය සඳහන් කරන්න.

a. සිසිලස Cool Spot
b. පීරිස් සහ පුත්‍රයෝ
c. මහනුවර රාජධානි සිංහ සමාජය
d. පුලතිසි ගොවි සමූපකාර සමිතිය. (ලකුණු 2x4=8)

II කොටස - ගිණුම්කරණය (ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

05.

i. ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ කුමක්ද? (ලකුණු 02)

ii. තුෂාරගේ ව්‍යාපාරයේ පවතින පහත සඳහන් අයිතම ජංගම වත්කම්, ජංගම වගකීම්, ජංගම නොවන වත්කම් හා ජංගම නොවන වගකීම් යටතේ වර්ග කර දක්වන්න.

ලීබඩු සහ උපකරණ
වෙළඳ ණය හිමියෝ
වසර 2 කින් ගෙවිය හැකි බැංකු ණය
විකිණීමට ඇති බඩු තොගය (ලකුණු 02)

iii. සුරංගගේ ව්‍යාපාරයේ 2025 වර්ෂයට අදාළව තොරතුරු පහත දැක්වේ.

2025.01.01 සුරංග ප්‍රාග්ධනය ලෙස මුදලින් රු. 100 000 ක් සහ රු. 75 000 ක් වටිනා උපකරණ ව්‍යාපාරයට යෙදවීම.

වර්ෂයේ ලැබූ මුළු ආදායම රු. 275 000
වර්ෂයේ වියදම රු. 125 000
අමතර ප්‍රාග්ධනය යෙදවීම රු. 20 000
වර්ෂය තුළ සුරංග පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් ලබාගත් මුදල රු. 35 000

අවශ්‍ය වන්නේ,
(අ) 2025.12.31 දිනට හිමිකම් ගණනය කිරීම
(ආ) 2025.01.01 දින සිදුවූ ගනුදෙනු වලට අදාළ ද්විත්ව සටහන් ලියා දැක්වීම. (ලකුණු 04)

iv. 2026 ජනවාරි මාසයේ රසිකාගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දැක්වේ.

	වත්කම්			**=**	**හිමිකම්**	**+ වගකීම්**
	උපකරණ රු.	**තොගය රු.**	**ණයගැති රු.**	**මුදල් රු.**	**හිමිකම් රු.**	**ණයහිමියෝ රු.**
ආරම්භක තොගය	150 000	10 000	5 000	45 000	170 000	40 000
1				-5 000		-5 000
2				(වැටුප්) -20 000	-20 000	
3		+15 000				+15 000
4		-5 000		+7 500	+2 500	

අවශ්‍ය වන්නේ,

(අ) සිදුවී ඇති ගනුදෙනු වටිනාකම් සහිතව ලියා දැක්වීම.

(ආ) ගනුදෙනු අවසානයේ (වත්කම් = හිමිකම් + වගකීම්) යන මූලික ගිණුම්කරණ සමීකරණය පවතින ආකාරය දැක්වීම. (ලකුණු 04)

(මුළු ලකුණු 12)

06.

i. ලෙජරය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

ii. පහත දැක්වෙන එක් එක් ගිණුම්වල වැඩිවීම් සහ අඩුවීම් ගිණුම්වල සටහන් කෙරෙන්නේ හරට ද, බැරට ද යන්න දක්වන්න.

අංකය	ගිණුමේ නම	වැඩිවීම	අඩුවීම
1	මෝටර් රථ ගිණුම		
2	ණයහිමි ගිණුම		
3	පොලී ආදායම් ගිණුම		
4	ප්‍රාග්ධන ගිණුම		
5	ණයගැති ගිණුම		
6	රක්ෂණ ගාස්තු ගිණුම		
7	ගැනිලි ගිණුම		
8	බැංකු ණය ගිණුම		

(ලකුණු 02)

iii. වෙනුරගේ ව්‍යාපාරයේ 2026 ජනවාරි මාසයේ සිදුවූ පහත සඳහන් ගනුදෙනු ලෙජර් ගිණුම්වල සටහන් කරන්න. ලෙජර් ගිණුම්වල සටහන් කරන්න.

- 2026.01.01 ප්‍රාග්ධනය රු. 150 000 ක් යෙදවීම
- 2026.01.10 ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 85 000 ක උපකරණ මිලදී ගැනීම.
- 2026.01.15 රු. 20 000 ක භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ගැනීම.
- 2026.01.26 රු. 15 000 ක භාණ්ඩ තොගයක් රසික ගෙන් ණයට ගැනීම. (ලකුණු 04)

iv. ලිහිණිගේ ව්‍යාපාරයේ 2026.01.01 දිනට මුදල් ශේෂය රු. 43 000 කි.

ජනවාරි මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

2026.01.05 ල/අ 1 ණයගැතියෙකු වූ නිමාෂගෙන් රු. 16 000 ක් ලැබීම

2026.01.10 ල/අ 2 අමතර ප්‍රාග්ධනය යෙදෙව්වා රු. 40 000

2026.01.15 ව/අ 1 ණයහිමියෙකු වූ රවීෂ ට රු. 10 000 ක් ගෙව්වා.

2026.01.20 ව/අ 2 කඩකුලී ගෙවීම රු. 12 000

අවශ්‍ය වන්නේ,

ඉහත තොරතුරු මුදල් පොතේ සටහන් කර තුලනය කිරීම. (ලකුණු 04)

(මුළු ලකුණු 12)

For Educational Purpose Only

07.

i. ගෙවීම් වවුචරය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

ii. මූලික සටහන් පොත් හතරක් නම් කරන්න. (ලකුණු 02)

iii. ජයනිගේ ව්‍යාපාරයේ 2026 මැයි මාසය සඳහා සකස් කළ වට්ටම් තීරු සහිත මුදල් පොතෙන් උපුටාගත් කොටසක් පහත දැක්වේ.

දිනය	ල/අ	විස්තරය	ස/පි	වට්ටම්	මුදල රු.	දිනය	ව/අ	විස්තරය	ස/පි	වට්ටම්	මුදල රු.
26/5/1		ශේෂය ප/ගෙ			25 000	26/5/8		ණයහිමි (තරංග)		1 000	9 000
26/5/10		මනෝජා		500	45 000	26/5/9		මධුෂා		600	11 400
26/5/26		තරණී		300	2 700						

අවශ්‍ය වන්නේ,

(අ) 2026/5/8 සහ 2026/5/10 සිදුවී ඇති ගනුදෙනු ලියා දැක්වීම.

(ආ) දුන් වට්ටම් සහ ලද වට්ටම් ගිණුම් දැක්වීම. (ලකුණු 04)

iv. කාවින්දිගේ ව්‍යාපාරයේ 2026 ජනවාරි මාසයට අදාළ සුළු මුදල් ගෙවීම් තොරතුරු පහත දැක්වේ.

2026.01.01 දින අග්‍රිමය ලැබුණා - රු. 7 000

ජනවාරි මස සුළු මුදල් ගෙවීම් පහත දැක්වේ.

		රු.
1/6	ව/අ 1 ත්‍රිරෝද රථ ගාස්තු	750
1/10	ව/අ 2 සංග්‍රහ වියදම්	1 200
1/15	ව/අ 3 වත්සලාට ගෙවීම	1 500
1/23	ව/අ 4 ගමන් වියදම්	800
1/26	ව/අ 5 සීනි තේකොළ සඳහා	200
1/29	ව/අ 6 පිරිසිදු කිරීම	1 000

අවශ්‍ය වන්නේ,

(අ) ගමන්, සංග්‍රහ, විවිධ, සහ ලෙජර් ගිණුම් තීරු සහිතව සුළු මුදල් පොත පිළියෙල කිරීම.

(ආ) 2026.02.01 දිනට අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම. (ලකුණු 04)

(මුළු ලකුණු 12)

“The beautiful thing about learning is that nobody can take it away from you.” — B. B. King



Visit SLGURU.LK to download papers and notes.